## වෙල්ලස්සේ කැලෑකෝරාල වෙද පරම්පරාව

පාරම්පරික වෛද්‍ය එච්.එම්. සුදර්මා

පාරම්පරික වෛද්‍ය එච්.එම්. සුදු බන්ඩා මහතාගෙන් පැවත එන මෙම පාරම්පරික වෛද්‍ය ක්‍රමය පාරම්පරික වෛද්‍ය එච්.එම්. මුතු බන්ඩා, පාරම්පරික වෛද්‍ය එච්.එම්. බාරෝන් සහ පාරම්පරික වෛද්‍ය එච්.එම්. ආරියතිලක මහතාගෙන් උරුම වී වර්තමානයේ පාරම්පරික වෛද්‍ය එච්.එම්. සුදර්මා මහත්මිය විසින් පවත්වාගෙන යනු ලබයි.

### පරම්පරාවේ ප්‍රතිකාර ක්‍රමය තුළ දක්නට ලැබෙන විශේෂතා

1. වෙල්ලස්ස කැලෑ කෝරාල වෛද්‍ය පරම්පරාවේ සියලු ප්‍රතිකාර ක්‍රම දක්වා ඇත්තේ කවියෙනි.
2. රෝගී තත්වය මෙන් ම දෂ්ටයේ ස්භාවය දූත ලක්‍ෂණ අනුව තීරණය කෙරේ.
3. ප්‍රතිකාරයේ දී තත්ත්වය හඳුනා ගැනීම සඳහා විෂ කලාව, අමෘත කලාව යොදා ගනී.
4. කුපිත දෝෂය පරීක්‍ෂා කර බලා දෝෂ ධාතු ගත වී ඇති ආකාරය අනුව සලකා ප්‍රතිකාර කරනු ලැබේ.
5. ප්‍රදේශයේ වැවෙන ශාක හා පවත්නා ද්‍රව්‍ය අනුව ඖෂධ සකසා ගනී.
6. ප්‍රතිකාරය සඳහා කිසිදු මුදලක් අය නොකරයි.

### ප්‍රතිකාර විධි

1. මුලින් ම දෂ්ට ස්ථානය උණුසුම් ජලයෙන් හෝ දෙහි ලෙල්ලක් අතුල්ලා පිරිසිදු කරනු ලැබේ.
2. රෝගියාගේ දෂ්ට ස්තානය ඉතා ම තදය. පැගිරි කටුවකින් හෝ පිරිසිදු ලෝහ කටුවක් මඟින් දෂ්ට ස්ථානය මදක් සිදුරු කර රක්තය ප්‍රමාණයක් එළියට ඒමට සලස්වා විෂ ගල තබා විෂ අද්දනු ලැබේ. විෂ ගල නොමැති විට ඔළිඳ ඇටයක් දෙපළු කර තැබීම ද සුදුසුය.
3. පසුව දෙහි කොළ අත්තෙන් විෂ බෑම සිදු කරයි. ඒ සඳහා කොළ නවයකින් යුක්ත දෙහි කොළ අත්තක් යොදා ගනී. රෝගියාගේ තත්වය අනුව 7, 9, 21 වර ආදී වශයෙන් විෂ බාන මන්ත්‍රයකින් මතුරා විෂ බානු ලැබේ. මෙහි දී රෝගියාගේ දෙපතුල් මැටි පොළොවට ස්පර්ශ වන සේ තබා ගත යුතුය.

''ඕං විෂ කන්ධ වසත් නයිරේ
විෂ දු හාරේ චක්යාල් චේල් චේව මේ
ඉලක්කන් මේ ආතුරයාගේ හිස සිට
දෙකෙන් දේලු විෂ දවම් පලවම්
නැතෙයි කී බොරුයි කී වාඩා පොථ''

### දෂ්ට ස්ථානයේ ඉදිමුම සහිත විට

ඉදිමුම සහිත නම් ඒ සඳහා මැල්ලුම් යෙදිය යුතුය. දෙහි කොළ, පොතු, කහ, ලූනු දමා කොටා මලවා බැඳීම.

**රෝගියාගේ වකුගඩු ආරක්ෂා කර ගැනීමට**

සර්ප දෂ්ටයකදී විශේෂයෙන් ම රෝගියාගේ වකුගඩු ආරක්ෂා කර ගත යුතුය. ඒ සඳහා ඖෂධ යෙදීම මෙම පරම්පරාව විශේෂයෙන් සිදු කරයි.

ඒ සඳහා විශේෂිත ඖෂධයක් ලෙස අසමෝදගම් ශාකය සම්පූර්ණයෙන් ගෙන වියළා කුඩු කර උණු වතුරෙන් තම්බා මද උණුසුමින් දීම සිදු කරයි.

අමතරව

නීරමුල්ලිය - ගොටුකොළ - පොල්පලා - මොණරකුඩුම්බිය

ලුණු වරණ පොතු - කසාය ලෙස සකසා දෙයි.

**රෝගියාගේ හෘදය ආරක්ෂා කර ගැනීම**

සර්පයෙකු දෂ්ට කරන ලද රෝගියෙකුගේ හෘදය ආරක්ෂා කර ගැනිම විශේෂයෙන් කළ යුතුය. ඒ සඳහා

1. ගොටු කොළ ඉස්මට එළඟි තෙල් දමා දීම
2. හීං උඳුපියළිය ඉස්මට එළඟි තෙල් දමා දීම සිදු කරයි.

**රෝගියාගේ ඇස් ආරක්ෂා කර ගැනිම**

විශෙෂයෙන් කරවැල් හා නාග දෂ්ට වල දී රෝගියාගේ ඇස් ආරක්ෂා කර ගත යුතුය. ඒ සඳහා අංජනං යෙදිම සිදු කරයි. උඳුපියළිය සියුම්ව අඹරා ඇසට යෙදීම එක් ප්‍රතිකාර ක්‍රමයකි.

**නස්න කිරීම**

සිහි මූර්ජා වූ විට පමණක් නස්න යෙදීම සිදුකරන අතර එහි ආකාර දෙකකි.

1. දෂ්ට කළ දිනය අනුව නස්න කිරීම
2. දෂ්ට කළ සර්පයා අනුව නස්න කිරිම

**දෂ්ට කරන ලද දිනය අනුව නස්න කිරිම**

ඉරිදා කැවොත් යමෙකුට දන්නේ
ඉරමුසු ඒකාවේරිය ගන්නේ
දූරිනර මුත්‍රෙන් නස්න කරන්නේ
ඉරිදා නස්නය දූනගනු මෙයිනේ

සඳුදා දිනයට නස්නය නියටය
මුදුසස්සද තුඹ කරවිල මුලමය
යොදා දෙහි ඇඹුලින් කරගන්නයි
සඳුදා නස්නය රුසින් කීවයි

**දෂ්ට කළ සර්පයා අනුව නස්න කිරීම**

මඟුලේ යන්නන් දූකලා - කුඹුරේ මඩ කලල් කළා

වැස්සට පැළ යට ඉඳලා - නාග විෂට නස්න කළා

**රෝගියාට කරන ප්‍රතිකාර පලක් නොවන විට**

රෝගියාට සිදු කරන ලද ප්‍රතිකාරවලින් කිසිදු පලක් නොවන විට විෂ බැඳී ඇති බවට තීරණය කරයි. එවිට විෂ බන්ධනය ඉවත් කළ යුතුය. ඒ සඳහා මතුරා දෙහි කැපීම සිදු කරයි.

**දෙහි කැපීම**

දෙහි මල් බුලත් තටුවේ තබා ජීවං කර දුම්මල දිෂ්ටි කර දුම් දී අවශ්‍ය ප්‍රමාණයට දෙහි ජප කර දෙහි කැපීම සිදු කරයි.

විෂ බන්ධනය කැපීම සඳහා මන්ත්‍රය

''ඕං ආරාඩිකාලා වාරා මේඩ් මුන්නේ ඒස්වාහ''